# ස්වර අතර තනි වී

පෙමින් මල් දම් ගෙතූ දැත ම මගේ මරණය යදිනවා
හොරෙන් මා ගත විඳපු දෑස ම ගිනි පුපුරු වී රවනවා
දිනෙන් දින දලු දාපු ප්‍රේමය කඳුළු වී ඇද වැටෙනවා
හිඳින්නම් සසරේ ම ඔබ හා කියපු ඔබ දුර ඇදෙනවා

තැලී පොඩි වී ගිලිහුණා මල්, පොද වැස්ස රළු වුණු නිසා
පත්තිනිය සැඟවුණා කාලිට මුල් තැන ම ඕනෑ නිසා
පෙම්බරිය මගෙ වෙයන් එදවස නොනැවතී කිව් බෝ මුසා
ඇසුණොතින් උලලේනි මූසල හඬින් දෙස් දෙයි කෑ ගසා

කටුක මොහොතෙ ම අසනි වැස්සත් ගිගුම් රාවය දුන් නිසා
මලණ්ඩිය හැමදා ම බැලුවේ කැත්තෙ මුවහත ඉකි ගසා
කවුද කීවේ කඳුරු තිත්ත යි කෑවෙ හප හප රස නිසා
උඹේ කොටහත් එක්කලා මන් කෑවේ බඩගිනි වැඩි නිසා

මස්සිනාලා දෙන්න ඇයි මේ විරසකෙන් දෙපසට වෙලා
උඹල මගෙ මුළු ලෝකෙ ම යි කිරි නැති ව මම අම්මෙක් වෙලා
මල්ලියේ බුදු ගැහුවේ නෑ ඔහු මම යි වැටුණේ ලිස්සලා
නෑනගේ කලලයේ හිමිකම උගෙ නොවේ බොට වැරදිලා

ගීකියනගේ හේෂානි ප්‍රභාකුමාරි පළමු වසර
සිංහල අධ්‍යයනාංශය
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය
heshani.17842@uhss.ruh.ac.lk

9 772950 655005